# සූත්‍ර පිටකයෙන් හෙළි වන රාෂ්ට්‍රපාලන විධි

කොට්වාවේ නන්ද හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

බුද්ධ ධර්මයේ දාර්ශනික න්‍යායක් වන අනිත්‍ය දුක්ඛ හා අනාත්ම යන ත්‍රිලක්ෂණ සංකල්පය ගැන පමණක් කථා කරන, ඇතමුන් බුදු දහම ජීවිතයේ දුක්ඛදායී පැත්ත ගැන පමණක් කරුණු දක්වන ආගමක් යයි විවේචනයට ලක් කරති. එය සත්‍යයෙන් තොර ප්‍රකාශයක් ලෙස පළමුව අවධාරණය කළ යුතුයි.

බුදු දහම භික්ෂූන්ට පමණක් සීමා නොවූ සමාජයේ නොයෙක් අංශ පිළිබඳ, විවිධ තරාතිරම් වල පුද්ගලයන් ගැන සාකච්ඡා කරන දර්ශනයකි. රජ-සිටු-ඇමති-ගොවි-බමුණු-ව්‍යාපාරික හා කම්කරු ආදී බොහෝ අංශ පිළිබඳ තොරතුරු සූත්‍රපිටකයෙන් හමුවේ.

මේ ලිපියෙන් මා විමර්ශනයට ලක් කරන්නේ බුදුරජාණන් වහන්සේ රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ කුමන ආකල්පයක් දරා තිබේ ද? යන්න පිළිබඳවයි. ප්‍රධාන වශයෙන් චක්කවත්ති සීහ නාද - අග්ගඤ්ඤ - කූටදන්ත හා මහා පරිනිබ්බාණ යන සූත්‍ර අධ්‍යයන කිරීමෙන් ජනහිතකාමී ශ්‍රේෂ්ඨ පාලකයෙකුගේ ස්වභාවය අවබෝධ කර ගත හැක.

බුද්ධ කාලීන භාරත සමාජයෙහි වර්ණභේදවාදය ප්‍රබලව පැවතිණ. ඒ අනුව බමුණු මතය වී තිබුනේ රාෂ්ට්‍ර පාලනය සඳහා රජෙකු සතු විය යුතු මූලික වූත්, ප්‍රධාන වූත් සුදුසු කම උපතින් ක්ෂත්‍රියෙකු වීමය. බුදුපියාණෝ එය තරයේ ප්‍රතික්ෂේප කළහ.

## ප්‍රජාතන්ත්‍රවාදය

පූර්ණ මිනිස් නිදහස හා මානුෂීය අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අනිවාර්ය අංග විය යුතුයි. මෙහි ප්‍රමුඛස්ථානය ලැබෙන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේටය. මිනිසෙකු වශයෙන් අවබෝධ කළ හැකි උසස්ම ධර්මය අවබෝධ කළ උන්වහන්සේ ලද හැකි උසස්ම පදවිය වූ බුද්ධරාජ්‍යය ලබා ගත්හ. ලෝකයේ යථාතත්ත්වය දන්නා එබඳු උතුමෙකුට තම දර්ශනය - ධර්මය පිළිගත යුතුයයි තරයේ කිව හැකිය. එහෙත් එතුමෝ එසේ නොකළහ. සිතීමේ, විමසීමේ පූර්ණ නිදහස දී ඇත. 'මා තක්ක හතු මා නය හෙතු මා ආකාරපරිවිතක්කෙන මා දිට්ඨි නිජ්ඣාන ඛන්තියා එථ තුම්හෙ කලාමා මා අනුස්සවෙන මා පරම්පරාය මා පිටක සම්පදානෙන.......... !' තර්කයට - න්‍යායකට ගැලපෙන නිසා හෝ මතුපිට ආකාරයෙන් බැලීමෙන් හෝ ගරු කරන , උතුමෙකු කී නිසා හෝ යමක් නොපිළි ගත යුතුයි. යම් විටෙක මෙය කුසලය, මෙය අකුසල යැයි සිය බුද්ධියට වැටහේද එවිට පිළිගන්න. යන දේශනාවේ ගැබ්ව ඇත්තේ සම්පූර්ණ ප්‍රජාතාන්ත්‍රිය ලක්ෂණයි.

යුක්තිය සාධාරණය සදාචාරය දැහැමිබව හා බිය සැකයෙන් තොරව ජීවත් වීමේ හැකියාව මෙන්ම ආර්ථික සාමාජික සුරක්ෂිතතාවය මහ ජනයා විශේෂයෙන් බලාපොරොත්තු වන අතර පාලකයා විසින් එබඳු තත්ත්වයක් උදාකර දිය යුතුයි. දැහැමි ප්‍රතිපත්ති මාලාවකින් ජනතාව රංජනය කළ යුතුයි. රටවැසියාගේ සුඛිත මුදිත තත්තවයට මෙන්ම දුකින් දොම්නසින් අසහනයෙන් ගෙවන ජීවන තත්ත්වයට ද මූලික වශයෙන් වගකිව යුත්තා රාජ්‍ය නායකයාය. ඔහුගේ ක්‍රියා පද්ධතිය පාලිතයා කෙරෙහි තදින්ම බලපාන බැවිනි. 'ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනයා විසින් මහජනයා උදෙසා ක්‍රතු ලබන මහජනයාගේම පාලන ක්‍රමයකි.' යනුවෙන් ඒබ්‍රහම් ලින්කන් විසින් හඳුන්වාදී ඇත.

පවත්නා පාලන ප්‍රතිපත්ති නිසා රටේ, අයුක්තිය අසාධාරණය අල්ලස් මිනීමැරීම් දූෂණ ආදිය බලපවත්වයි නම් එම ආණ්ඩු බලයෙන් පහ කිරීමටත් අභිමත ආණ්ඩුවක් පත්කර ගැනීමටත් ඡන්ද බලය හිමි පුරවැසියන්ට අවස්ථාව ලැබේ. බලයට පත්වන රජය බහුජන මතයට කන්දිය යුතු අතර ඡන්දය ලබාගැනීමේදී දරන උත්සාහය හා සමානව මහජනයාට සේවය කිරීමේදී අපක්ෂපාතී විය යුතුයි.

බුදුන්, පිරිනිවීමෙන් පසු සසුනේ නායකත්වය පුද්ගලාධිකාරයකට නොදී, ධර්ම - විනයටම හිමි බව වදාළහ. 'මයා ධම්මොච විනයොච දෙසිතො, සො වො මමච්චයෙන සත්ථා' මෙයින් සමාජයක හෝ සමාජ සංස්ථාවන හෝ පරිපාලනය ධාර්මික විය යුතු බව අවධාරණය කරයි.

## බෞද්ධ දේශපාලන මූල ධර්ම

එහිලා දසරාජධර්මවලට හිමි වනුයේ වැදගත් ස්ථානයකි. දානය, සීලය, පරිත්‍යාගය, සෘජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම හා වෛර නොකිරීම යන දසය ධර්මිෂ්ඨ රාජ්‍ය නායකයෙකු සතුවිය යුතු උසස් ගුණාංගයෝ වෙති.

චක්කවත්තිසීහනාද සූත්‍රයේ, සක්විති රජෙකුගේ දැහැමි ක්‍රියාකලාපයක් වසයෙන් දස සක්විතිවත් දක්වා තිබේ. මේවායින් සමාජයේ ඒ ඒ කණ්ඩායම් වල විවිධ අවශ්‍යතා ඉටු කළ යුතු අයුරු දක්වයි. එයින් මහ ජනයා සුඛිත මුදිත වන අතර රටේ සමෘද්ධිය ඇතිවේ.

වජ්ජි සමූහාණ්ඩුවේ පැවති ඉපැරණි දේශපාලන ප්‍රතිපත්ති මාලාවක් වන සප්ත අපරිහානිය දම්, සංඝ සමාජයට ද ආදර්ශයක් කොට දක්වමින් බුදුරදුන් පැසසුමට ලක් කළ අයුරු මහා පරිනිබ්බාණ සූත්‍රයේ එයි. එහි දක්වන 'නොපැන වූ නීති නොපැනවීම' නූතන රාජ්‍ය ප්‍රතිපත්ති මත වෙනස් කිරීමට සිදුව ඇතත් සෙසු කරුණු වත්මන් පාලනතන්ත්‍රයන්හි ගුණාත්මක බවේ වර්ධනයට ඉවහල්වේ.

1. නිතර එක් රැස් වීම.
2. සමඟිව රැස්ව සමඟිව කටයුතු කර සමඟිව විසිරයාම.

3. පෙර වජ්ජි රජ දරුවන් නොපැන වූ නීති නොපැනවීම.
4. වැඩිහිටියන්ට ගෞරව දැක්වීම.
5. කුලකාන්තාවන් බලයෙන් තමන් වෙත නොගැනීම.
6. ආගමික ආයතන වලට කරගෙන ආ පුදපූජා නොනැවත්වීම.
7. ගුණවත් උතුමන් සිය රට කැඳවා ගැනීමත්, පිටරට වලදී ගෞරව දැක්වීමත්

යන කරුණු වජ්ජි රජ දරුවන් තුළින් ගිලිහී නොයනතාක් කිසිම සතුරෙකුට ඔවුන් පරාජය කළ නොහැකි බව බුදුරදුන් සුනීධ - වස්සකාර ඇමතිවරුන් දෙදෙනා අමතා වදාළහ.

'කූටදන්ත සූත්‍රයට අනුව රටවැසියාගේ ආර්ථික පරිහානිය නිසා සමාජගත දුක ඇති වන බව පැහැදිලිවේ. සමාජය දූෂණය වන සොරකම, වංචාව, කලකෝලාහල ආදිය බොහෝ විට දරිද්‍රතාවය හා අත්වැල් බැඳගෙන පවතී. පෙර, මහාවිජිත රජගේ පොරෝහිත බමුණා රටවැසියාගේ හා රටේ සමෘද්ධිය උදෙසා කළ යුතු ක්‍රියා මාර්ගය පහදා දුන් අයුරු දිනක් බුදුරජාණන් වහන්සේ කූටදන්ත බමුණා අමතා වදාළහ. ගොවිතැන් කරන්නවුන් හට බිජුවටද, වෙළදාම ජීවනවෘත්තිය කරගෙන ඇති අයට මූල ධනයද, රාජ්‍ය සේවකයන්ට බත් වැටුප් ද දිය යුතුය. මෙසේ කළ පසු ඒ ඒ අය තම කටයුතු කිරීමට පෙළඹෙති. එහි ප්‍රතිඵලය වනුයේ රටේ සොරබිය නැතිවීමත්, ජනතාව ඔවුනොවුන් සතුටින් ජීවත්වීම යනාදියයි. එයින් රට ස්වයම්පෝෂිත වන්නාසේම රජයට ද ආදායම් ලැබේ. 'තෙනහි භවං රාජා යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති කසිගොරක්ඛෙ, වණිජ්ජාය තෙසං භවං රාජා බීජ භත්තං අනුප්පදේතු යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති වණිජ්ජාය, තෙසං භවං රාජා භතං අනුප්පදේතු.'

තවද දැහැමි පාලනය ගැන කරුණු දක්වන චක්කවත්තිසීහ නාද සූත්‍රය ද ඉතා වැදගත්ය. දස සක්විතිවත් අනුව රට පාලනය කරන සක්විති රජවරු සිය වාසනා මහිමය ගෙවී යාමෙන් චක්‍රරත්නය අහිමි වූ පසු තම පුතුට රාජ්‍යය පවරා අබිනික්මන් කෙරෙති. සක්විතිවත් අනුව රට පාලනය කරන නව රජගේ පුණ්‍ය බලයෙන් යළි චක්‍රරත්නය පහළ වේ. 'දළ්හනෙමි' නම් සක්විති රජුගේ පුත් රජ සක්විතිවත් නොසලකා හැර සිය අභිමතය පරිදි පාලන කටයුතු ගෙන ගියෙන් චක්‍රරත්නය පහළ නොවිණි. පසුව ඇමති ගණයාගේ උපදෙස් පරිදි දැහැමින් රාජ්‍යය විචාළේය. එහෙත් දිළින්දන්ට ධනය නොදීම නිසා රටේ සොරසතුරු බිය හා දූෂණ ඇති විය. 'අධනානං ධනෙ අනුප්පාදියමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි දාළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි ............... අමත්තෙය්‍යතා, අපෙත්තෙය්‍යතා.............. තෙසං සත්තානං ආයුපි පරිහායි................ තෙසං සත්තා නං අඤ්ඤමඤ්ඤම්හි තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති.................... තෙ අඤ්ඤමඤ්ඤම්හි මිගසඤ්ඤං පටිලභිස්සන්ති .........තෙ තිණ්හෙන සත්ථෙන එසමිගො එසමිගොති අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙස්සන්ති' රජ බුද්ධිමත්ව ක්‍රියා නොකිරීම නිසා ඇත කොටා ගැනීම් හා මිනීමැරුම් පවා ජනතාව අතර හටගන්නා බව මින් පැහැදිලිව පෙනේ.

තවද අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ජනතාව අතර ධනය සමසේ බෙදී නොයාමෙන් සුළු පිරිසක් විසින් ආර්ථික සම්පත් හිමිකරගෙන ධනවාදී ප්‍රතිපත්ති මත පාලන කටයුතු කරන විට සොරකම, වංචාව, මිනිසුන් තුළ ඔවුනොවුන් කෙරෙහි සැකය වර්ධනයවීමෙන් අධර්මය ඇතිවී විවිධ දුසිරිත් සමාජයේ ප්‍රමුඛස්ථානයක් ගන්නා බව දැක්විය හැක.

පුද්ගල දූෂණයෙන් සමාජය දූෂණය වීමට ඉඩ නොතබා ධාර්මික පාලනය කිරීම පිළිබඳ වැදගත් කරුණු 08ක් අග්ගඤ්ඤ සූත්‍රයේ හමුවෙයි.

1. රජ ධාර්මිෂ්ඨ වීම.
2. ශ්‍රමණ බමුණන්ට ගරු කරන, එම උපදෙස් පිළිපදින, නිර්ලෝභී අයෙකු වීම.
3. යහපත් ක්‍රියා ඇති බව
4. බුද්ධිමතෙකු වීම. (කෛරාටික නොවීම)
5. උගතෙකු වීම.
6. කුමන ප්‍රශ්නයකදී වුවත් කාලයට අනුව බැලිය හැකි වීම.
7. උඩඟු නොවීම.
8. ප්‍රඥාසම්පන්න වීම.

ත්‍රිපිටකයෙහි රජු හඳුන්වන තැන රජෙකුට 'ධම්මිකො ධම්ම රාජා' යන වචන භාවිතා කර ඇති අයුරු දැකිය හැක. හේතුව, යුක්ති සහගත සාධාරණ ප්‍රතිපත්ති අනුව, බියසුළු නොවී පාලනය ගෙනයමින් සිව්දිග ජය ගෙන ජනපද තහවුරු කොට දැහැමින් පාලන තන්ත්‍රය හසුරුවා ගත යුතු බැවිනි.

'රාජා චක්කවත්ති ධම්මිකො ධම්ම රාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො ............ සො ඉමං පඨවිංසාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන අභිවිජය අජ්ඣාවසති.'

රාජ්‍ය තාන්ත්‍රික කටයුතු වලදී ඒවා රට වැසියාට ඒත්තුගැන්විය හැකි ආදර්ශවත් බවක් පාලකයා තුළ විද්‍යමාන විය යුතුය.

i දානය iii අර්ථ චර්යාව
ii ප්‍රිය වචනය iv සමානාත්මතාව

යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාව පිනවමින් ඔවුන්ගේ සිත් සතුටු කොට ජනතා ප්‍රසාදයට පත්වීම අත්‍යවශ්‍යය. මේ කටයුතුවලදී රජ තෙමේ ඡන්දයෙන්, ද්වේශයෙන්, භයෙන්, මෝඩකම් වලින් අගතිගාමී නොවීම, තම යසස, කිත්ගොස පැතිර යාමේ හේතුවක් වන්නේය.